තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## ආර්.එස්. එල්.ඩී. ගමගේ එ . ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහර

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 508/2018 (2019.05.13) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ආර්.එස්.ජී.ඩී. ගමගේ
**නොතිසි ලත් පාර්ශවය**- ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහර

**පෙනීසිටීම**
අභියාචක - පැමිණ නැත.
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.ඩී. කුමාරි- සහකාර ප්‍රාදේශීය ලේකම්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.02.22 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2018.03.07 |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.04.02 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.05.17 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.02.22 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

ම/210/2/202/3653/50 ලිපිගොනුවට අදාළ 2010-2018 දක්වා ගෙවීම් නොකිරීම සම්බන්ධ සියලුම විස්තර

මෙම ඉඩම් කොටසට අදාළව ආර්.එස්.එල්.ඩී. ගමගේ මහතාට අමතරව තවත් පාර්ශවයක් හිමිකම් පෑමට ඉදිරිපත් වීම නිසා අදාළ හිමිකම් පරීක්ෂණයේදී ආරවුල් තත්වයක් පැන නැගිණ. එබැවින් ඒ සම්බන්ධයෙන් ඉඩම් අත්පත් පනතේ 10(1) අ වගන්තිය යටතේ තීරණයක් ලබා දී ඇත. ඒ තීරණයේ පිටපත් අදාළ පාර්ශවයන් වෙත දන්වා යවා ඇත.

ඒ අනුව මෙම ඉඩම් කැබැල්ලේ හිමිකම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා අදාළ ලියකියවිලි 2017.09.02 දින ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් නඩු අංකයක් මෙතෙක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් තොරතුරු නිලධාරී වෙත ලබා දී නැත.

එබැවින් මෙම ඉඩමේ හිමිකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වාචික ප්‍රකාශ ආදියෙහි පිටපත් නිතිකෘත්‍යයන් සඳහා ඉදිරිපත් කර ඇති බැවින් ගරු නීතිපතිතුමාගේ නිසි අවසරයකින් තොරව ඒවායෙහි පිටපත් නිකුත් කළ නොහැකි බව දන්වමි.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018.04.02 2018.04.02 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.05.17 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක පැමිණ නැත. පොදු අධිකාරිය පැමිණ සිටී.

**නියෝගය:**

අභියාචනය කල් තබන ලදී.

මීළඟ දිනය- 2019.08.26 ප.ව. 12 :15

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*******************************************

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 508/2018 (2019.08.26) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**පෙනීසිටීම**

අභියාචක - **ආර්.එස්. එල්.ඩී. ගමගේ**

පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.ඩී. කුමාරි- සහකාර ප්‍රාදේශීය ලේකම්

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

ඉඩමට අදාළ ගෙවීම් සම්බන්ධ විස්තර ඉදිරිපත් විය. ඉඩම සම්බන්ධ නඩු දෙකක් පවතී. නීතිපතිගෙන් අවසරයක් ලැබුණු පසු නිරාකරණය කළ හැකි බව පොදු අධිකාරිය පවසයි. එය නුදුරු දිනයක අවසන් විය හැකි බව පොදු අධිකාරිය පවසන හෙයින් ඒ බව සනාථ කර ගැනීම සඳහා නැවත කැඳවීමට යොමු කරනු ලැබේ.

**නියෝගය:**

අභියාචනය කල් තබන ලදී.

මීළඟ දිනය 2019.11.11 ප.ව.12:15

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.